

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education



අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - පෙරහුරු පරීක්ෂණය 2026
General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2026

13 ශ්‍රේණිය	23	S	I	දේශපාලන විද්‍යාව I Political Science I	කාලය : පැය දෙකයි Time : Two hours

උපදෙස් :

- මෙම ප්‍රශ්න පත්‍රය A සහ B යනුවෙන් කොටස් දෙකකින් සමන්විත වේ.
- A කොටස බහුවරණ ප්‍රශ්න 30 කින් සහ B කොටස කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 20 කින් යුක්ත වේ.
- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම සැපයිය යුතු වේ.
- එක් ප්‍රශ්නයකට ලකුණු දෙක බැගින් මුළු ලකුණ 100 කි.

A කොටස

- අංක 01 සිට 20 තෙක් ඇති ප්‍රශ්නවලට නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

01. දේශපාලන විද්‍යාව,
   (1) දේශපාලනඥයින් පුහුණු කරන ශාස්ත්‍රීය විෂයක් වේ.
   (2) ශාස්ත්‍රීය ලෙස හැදෑරීම පිළිබඳව දීර්ඝ ඉතිහාසයක් නැත.
   (3) මෙහි ප්‍රවේශයන්, න්‍යායන්, සහ විධික්‍රමයන් බහුවිධයි.
   (4) හැදෑරිය යුත්තේ විද්‍යාත්මක විධික්‍රමයන්ට අනුරූපව පමණි.
   (5) සමාජීය විද්‍යා ගණයට අයත් නොවන විෂයකි.

(.....)

02. දේශපාලන මතවාද
   (1) සමාජ කොටස් දේශපාලන ක්‍රියාකාරිත්වයට යොමු කිරීමේ හැකියාවක් නොමැත
   (2) මිනිසුන් දේශපාලන ක්‍රියාවලියෙන් ඈත් කොට තබයි.
   (3) මිනිසුන්ගේ දේශපාලන විඥාණය අක්‍රිය කරයි.
   (4) එකිනෙකට සංගත අදහස් මාලාවකින් සමන්විත වේ.
   (5) අවිනිශ්චිත වූ අදහස් සමුදායකි. (.....)

03. ඒකීය රාජ්‍යය,
   (1) පරිපාලනය විමධ්‍යගත කිරීම සිදුවේ.
   (2) සංකීර්ණ සමාජවලට වඩා යෝග්‍ය වේ.
   (3) ද්විමාණ්ඩලවාදය මත පදනම් වේ.
   (4) රාජ්‍යයේ ස්වාධිපත්‍ය බලය බෙදාගෙන ක්‍රියාත්මක කරනු ලැබේ.
   (5) මධ්‍යම ආණ්ඩුවට සිය අභිමතය පරිදි පළාත් ආණ්ඩු හැඩගැස්වීමට නොහැකි වේ.

(.....)

04. ජනාධිපති ආණ්ඩුක්‍රමය,
   (1) පාර්ලිමේන්තුවේ සභාය මත ආණ්ඩුව රඳා පවතී.
   (2) ව්‍යවස්ථාදායකය හා විධායකය එකම මැතිවරණයකින් තෝරා ගනී.
   (3) විධායකය හා ව්‍යවස්ථාදායකය අතර විධිමත් පුද්ගල බෙදීමක් පවතී.
   (4) ජනාධිපතිවරයා හා කැබිනට් මණ්ඩලය සාමූහික ලෙසින් පාර්ලිමේන්ටයට වගකිව යුතුය.
   (5) මෙම ආණ්ඩුක්‍රමය ලොව පුරා පැතිරුණු ආණ්ඩු ක්‍රමයක් වේ.

(.....)

Past Papers Wiki

05. ගැටුම,
(1) ගැටුම සෑම විටම නිශේධනීය ප්‍රතිඵල ඇති කරයි.
(2) ගැටුම පැන නඟින්නේ පාර්ශවකරුවන් අතර සමනය කළ නොහැකි අරමුණු නිසාය.
(3) ගැටුම සමාජ ජීවිතයට අදාළ නොවේ.
(4) ප්‍රචණ්ඩ ගැටුම් සහමන්ත්‍රණය මඟින් පරිවර්තනය කිරීම දුෂ්කර නොවේ.
(5) ගැටුම සමාජය වෙනස් කිරීමට දායක නොවේ. (.....)

06. රාජ්‍ය ප්‍රතිපත්තිය,
(1) රාජ්‍ය ප්‍රතිපත්තියක් ක්‍රියාදාමයක් මත පදනම් නොවේ.
(2) රාජ්‍ය ප්‍රතිපත්තිය හැදෑරීම දෙයාකාර ස්වභාවයක් ගනී.
(3) රාජ්‍ය ප්‍රතිපත්තිය සඳහා ව්‍යවස්ථාදායකයේ කාර්යභාරයක් නොමැත.
(4) රාජ්‍ය ප්‍රතිපත්තිය හැදෑරීමට දීර්ඝ ඉතිහාසයක් ඇත.
(5) න්‍යාය පත්‍රයකින් තොරව සිදු කරන ක්‍රියාවලියකි. (.....)

07. ගෝලීකරණය යනු,
(1) මාක්ස්වාදී දේශපාලන හා ආර්ථික ප්‍රතිසංස්කරණවල ප්‍රතිඵලයක් වේ.
(2) ජාතික රාජ්‍යවල දේශසීමා අර්ථාන්විත කර ශක්තිමත් කරයි.
(3) ගෝලීය ප්‍රාග්ධනය රාජ්‍යයේ ග්‍රහණයෙන් මිදී ස්වාධීනතාවක් ලබා ඇත.
(4) ස්ථීර අරමුණු මඟින් මනුෂ්‍යයන් එකට බැඳ තබයි.
(5) මෙහි ප්‍රවණතාව වන්නේ රාජ්‍යයේ අභ්‍යන්තරයේ ඇති සාධකවල, බලවේගවල ආධිපත්‍යයක් ඇති වීමයි.
(.....)

08. දේශපාලන පක්ෂ,
(1) දීර්ඝ ඉතිහාසයකට හිමිකම් ලබයි.
(2) ආණ්ඩුවේ පිටතින් සිට ආණ්ඩුවට බලපෑම් කරයි.
(3) පෞද්ගලික අරමුණු ඉටු කරවා ගැනීම අරමුණ වේ.
(4) මැතිවරණ හෝ වෙනත් මාධ්‍යයක් මඟින් ආණ්ඩු බලය ලබා ගනී.
(5) මේවාට ලැබෙන බලය සුජාතභාවයකින් යුක්ත නොවේ. (.....)

09. ස්වාධිපත්‍යය,
(1) ගෝලීයකරණය මඟින් අභියෝගයට ලක් වී නොමැත.
(2) සියල්ල වසා පැතිරෙන සංකල්පයක් නොවේ.
(3) වෙනත් කිසිදු සමානයකුට යටත් නොවේ.
(4) ඒකීය දෙයක් නොවේ.
(5) වර්තමානයේ දුබල රාජ්‍යයන්හි ස්වාධිපත්‍ය වර්ධනය වී ඇත. (.....)

10. සමාජවාදී මතවාදය,
(1) පන්ති විභේදනය තව දුරටත් අවශ්‍ය බව පිළිගනියි.
(2) බහු පක්ෂ ක්‍රමය අනුමත කරයි.
(3) කොමියුනිස්ට් යුගයේ දී රාජ්‍ය පවතින බව කියයි.
(4) විප්ලවය මඟින් බලය ලබා ගැනීම ප්‍රතික්ෂේප කරයි.
(5) දේපොළ පිළිබඳ සමාජයේ පොදු අයිතිය පිළිගනියි. (.....)

11. ව්‍යවස්ථානුකූලවාදය,
    (1) පාලකයාට අවශ්‍ය පරිදි ව්‍යවස්ථාව වෙනස් ළ හැකියි.
    (2) නීතියේ ආධිපත්‍යය නොසලකා හරියි.
    (3) පුරවැසියන්ගේ මූලික අයිතීන් උල්ලංඝනය කරයි.
    (4) ඒකාධිපති පාලන ක්‍රමවල දක්නට ලැබේ.
    (5) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක පැවැත්ම මඟින් ආණ්ඩුවක් ක්‍රියාත්මක වේ. (.....)

12. පශ්චාත් යටත් විජිත රාජ්‍ය,
    (1) ප්‍රජාතන්ත්‍රවාදී පරිවර්තනය සාර්ථකව සිදු වී ඇත.
    (2) යටත් විජිත රාජ්‍ය ව්‍යූහය තව දුරටත් ඉදිරියට ගෙන ගොස් නැත.
    (3) අධිකාරිවාදී පාලන තන්ත්‍ර බිහි වී නැත.
    (4) දේශපාලන පක්ස සිවිල් දේශපාලන ආයතනවලට වඩා බලවත් වී ඇත.
    (5) ආණ්ඩුකරණය තුළ බහුත්වවාදය යථාර්තයක් කර ඇත. (.....)

13. ඉන්දීය ෆෙඩරල් ක්‍රමයේ ලක්ෂණයක් වන්නේ,
    (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් "සන්ධිය" යන්න ප්‍රකාශ කර තිබේ.
    (2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනම්‍ය වේ.
    (3) පුළුල් බලතල ප්‍රමාණයක් මධ්‍යම ආණ්ඩුවට හිමි කර දී ඇත.
    (4) හදිසි අවස්ථාවලදී ප්‍රාන්ත නීති බලවත් වේ.
    (5) ද්විත්ව පුරවැසිභාවයක් දක්නට ලැබේ. (.....)

14. ඇමරිකානු සන්ධිය ක්‍රමය තුළ මධ්‍යමආණ්ඩුවේ බලය වර්ධනය වීමට බලපාන ලද හේතුවක් නොවන්නේ,
    (1) ඇමරිකානු ජනතාව ශක්තිමත් මධ්‍යම ආණ්ඩුවක් ඉල්ලා සිටීම.
    (2) ජාතිකවාදයේ නැගී ඒම.
    (3) ශ්‍රේෂ්ඨාධිකරණය විසින් වර්ධනය කරන ලද ව්‍යාංගික බලය පිළිබඳ න්‍යාය.
    (4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් මධ්‍යයට හිමි බලය සඳහන් කොට ශේෂ බලතල ප්‍රාන්තයන්ට ලබා දීම.
    (5) ඇතැම් කාර්යයන් සම්බන්ධයෙන් මධ්‍යම ආණ්ඩුව මත යැපීමට ප්‍රාන්තවලට සිදු වීම. (.....)

15. ප්‍රංශ ඩිගොල්වාදි ක්‍රමයේ ලක්ෂණයක් වන්නේ,
    (1) ජනාධිපතිවරයා ඡන්ද විද්‍යාලයක් මඟින් තෝරා ගනී.
    (2) ව්‍යවස්ථාදායකය ඒකමාණ්ඩලික වේ.
    (3) අගමැති ඇතුළු කැබිනට් මණ්ඩලයට සියලු විධායක බලය හිමි වේ.
    (4) ජනාධිපතිවරයා ජාතියේ එක්සත්කම පිළිබඳ සංකේතය වේ.
    (5) ප්‍රංශයේ දේශපාලන බලය විමධ්‍යගත කොට ඇත. (.....)

16. 1833 කෝල්බෘක් යෝජනාවක් නොවන්නේ,
    (1) ඉංග්‍රීසි අධ්‍යාපනය දියුණු කිරීම.
    (2) රාජකාරි ක්‍රමය අහෝසි කිරීම.
    (3) රජයේ වෙළඳ ඒකාධිකාරය පවත්වාගෙන යාම.
    (4) යුරෝපියන්ට වෙන් වූ අධිකරණ අහෝසි කිරීම.
    (5) ද්‍රව්‍ය වලින් බදු ගෙවීම වෙනුවට මුදලින් බදු ගෙවීම හඳුන්වා දීම. (.....)

17. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ "මුරබල්ලන්" ලෙස හැඳින්වූයේ,
(1) ආණ්ඩුකාරවරයාට ය.
(2) රාජ්‍ය නිලධාරීන් තිදෙනාට ය.
(3) ආණ්ඩුකරුට හා රාජ්‍ය නිලධාරීන් තිදෙනාට ය.
(4) රාජ්‍ය මන්ත්‍රණ සභාවේ මන්ත්‍රීවරුන්ට ය.
(5) අමාත්‍ය මණ්ඩලයේ ලාංකික ඇමතිවරුන්ට ය. (.....)

18. 1931 හඳුන්වා දුන් ඩොනමෝර් ප්‍රතිසංස්කරණ වලට අදාළ නොවන්නේ,
(1) ශ්‍රී ලාංකිකයන්ට සර්වජන ඡන්ද බලය ලැබීම.
(2) රාජ්‍ය මන්ත්‍රණ සභාව නමින් ඒකමාණ්ඩලික ව්‍යවස්ථාදායකයක් නිර්මාණය කිරීම.
(3) ලාංකික නායකයින්ට විධායක කටයුතු පිළිබඳ පුහුණුවක් ලැබීම.
(4) වාර්ගික නියෝජනය හඳුන්වා දීම.
(5) ශ්‍රී ලංකාව සුබසාධක රාජ්‍යයක් ලෙස වර්ධනය වීම. (.....)

19. 1947 සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ රාජ්‍ය සෙවිය පාලනය කරනු ලැබුවේ,
(1) රාජ්‍ය සේවා උපදේශක මණ්ඩලය මහිනි.
(2) අග්‍රාණ්ඩුකාරවරයා විසිනි.
(3) අමාත්‍ය මණ්ඩලය විසිනි.
(4) රාජ්‍ය සෙවා කොමිෂන් සභාව විසිනි.
(5) බ්‍රිතාන්‍ය රැජිණ විසිනි. (.....)

20. සෝල්බරි ව්‍යවස්ථාදායකයට අදාළ වන්නේ,
(1) බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු බලය හා සමාන විය.
(2) ඒක මාණ්ඩලික විය.
(3) සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයට ඕනෑම නීතියක් ගෙන ඒමේ හැකියාව තිබුණි.
(4) ඡන්දයෙන් පමණක් සියලු මන්ත්‍රීරු පත් වූහ.
(5) පනත් වලට අවසාන අනුමැතිය අග්‍රාණ්ඩුකරුගෙන් ලබාගත යුතු විය. (.....)

- අංක **21** සිට **25** තෙක් වූ ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශ කාණ්ඩය ඇතුළත් වරණය තෝරන්න.

21. ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයට අදාළ වන්නේ,
A. වර්ධනය වීම ආරම්භ වන්නේ බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන සමයේ දී ය.
B. ලංකාවේ ප්‍රථම දේශපාලන පක්ෂය වන්නේ ලංකා සම සමාජ පක්ෂයයි.
C. කරට කර තරහ කරන පක්ෂ රාශියකින් යුක්ත වේ.
D. පැරණි හා නව වම ලෙස ලංකාවේ වාමාංශික ව්‍යාපාරයේ ධාරාවන් දෙකක් දැකිය හැකිය.
E. ජනවාර්ගික පක්ෂ දක්නට ලැබීම කැපී පෙනෙන ලක්ෂණයකි.

(1) A B C D (2) B C D E (3) A B D E
(4) A C D E (5) A B C E (.....)

22. සමකාලීන ලෝක දේශපාලනයේ ප්‍රවණතාවක් වන්නේ,
A. බහු ධ්‍රැවීය ලෝක ක්‍රමයක් නිර්මාණය වීමය.
B. නැගෙනහිර ආසියාතික රටවල් ආර්ථික වශයෙන් බලවත් වීම ය.
C. ඇමරිකාව ලෝකයේ ප්‍රධාන බලවතා වීමය.
D. නව සමාජ ව්‍යාපාර බිහි වීමය.
E. විකල්ප ජාත්‍යන්තර සබඳතා ජාල ගොඩ නැඟීමය.

(1) A B C D (2) B C D E (3) A B D E
(4) A C D E (5) A B C E (.....)

23. ශ්‍රී ලංකාවේ ආණ්ඩු ක්‍රමයේ ඇති ප්‍රජාතන්ත්‍රවාදී අංග වන්නේ,

(A) මහජන ඡන්දයෙන් පත් කරන ව්‍යවස්ථාදායකය.

(B) බලය මධ්‍යගත වීම.

(C) සක්‍රීය සිවිල් සමාජයක් හා සමාජ ව්‍යාපාර පැවතීම.

(D) සාපේක්ෂ වශයෙන් ස්වාධීන අධිකරණය

(E) මැතිවරණ වලදී ඉහළ මට්ටමේ ඡන්දදායක සහභාගිත්වය.

(1) A B C D (2) B C D E (3) A B D E

(4) A C D E (5) A B C E (.....)

24. කලාපීය සහයෝගිතාවය සඳහා වූ දකුණු ආසියානු සංවිධානය,

A. සමන්විත වන්නේ දකුණු ආසියාතික රාජ්‍යයන් අටකිනි.

B. අන්තර්ජාතික සමාජයේ හඳුන්වන්නේ "දුප්පතුන්ගේ සමාජය" ලෙසයි.

C. 1985 දෙසැම්බර් 08 වැනිදා බංග්ලාදේශයේ 'ඩකා' අගනුවරදී ආරම්භ විය.

D. පුළුල් අරමුණු සහිත සංවිධානයක් වේ.

E. ක්‍රියාත්මක වන්නේ සාමාජිකයන් අතර සහයෝගය වර්ධනය කිරීම සඳහා ය.

(1) A B C D (2) B C D E (3) A B D E

(4) A C D E (5) A B C E (.....)

25. පොදු රාජ්‍ය මණ්ඩලය,

A. බ්‍රිතාන්‍ය රැජිණ නායකත්වය දරනු ලැබේ.

B. ප්‍රධාන ලෙස අවධානය යොමු කරන්නේ සාමාජික රාජ්‍ය අතර අධ්‍යාපනය, සෞඛ්‍ය, යහපාලනය ආදී ක්ෂේත්‍රවල සහයෝගය වර්ධනය කිරීමට ය.

C. ස්වේච්ඡා සංවිධානයක් වන අතර සාමාජිකත්වය විවෘත වන්නේ ස්වාධිපති රාජ්‍යයන්ට පමණි.

D. එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධිත සංවිධානයක් වේ.

E. ව්‍යවස්ථාවක් නොමැති ලෝකයේ ඇති එකම අන්තර්ජාතික රාජ්‍ය සංවිධානය වේ.

(1) A B C D (2) B C D E (3) A B D E

(4) A C D E (5) A B C E (.....)

- අංක **26** සිට **30** දක්වා දී ඇති ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්න අංකයට අදාළව දී ඇති යෙදුම් යුගලය සම්බන්ධයෙන් දැක්වෙන (1), (2), (3), (4) සහ (5) යන වරණවලින් කවර වරණය දැයි තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන් තුළ දක්වා ඇති තිත් ඉර මත ලියන්න.

අංකය	පළමුවැනි ප්‍රකාශය	දෙවෙනි ප්‍රකාශය
(1)	සත්‍ය	සත්‍ය
(2)	සත්‍ය	අසත්‍ය
(3)	අසත්‍ය	සත්‍ය
(4)	අසත්‍ය	අසත්‍ය
(5)	සත්‍ය	සත්‍ය වන අතර පළමුවැනි ප්‍රකාශය තව දුරටත් පැහැදිලි කරයි.

	පළමුවැනි ප්‍රකාශය	දෙවෙනි ප්‍රකාශය
26.	1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා මහජන ඡන්දයෙන් තෝරාපත් කර ගත්තේ ය.	ජනාධිපතිවරයා නාමික විධායකය වූ අතර ස්වකීය කාර්යභාරය ඉටු කළ යුතු වූයේ සත්‍ය විධායකයේ උපදෙස් මතය. (.....)

27.	1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එක් කරන ලද 13 වෙනි සංශෝධනය මඟින් පළාත්සභා හඳුන්වා දුන්නේ ය.	මෙම පළාත්සභා ආයතන ව්‍යවස්ථාදායක විධායක බලතල ක්‍රියාත්මක කළ හැකි පාලන ව්‍යූහයන් වේ. (.....)
28.	18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් පාර්ලිමේන්තු සභාවක් හඳුන්වා දුන්නේ ය.	ස්වාධීන කොමිෂන් සභාවලට සාමාජිකයන් සහ රජයේ ප්‍රධාන තනතුරුවලට පුද්ගලයන් පත් කිරීමේ දී ජනාධිපතිවරයා විසින් මෙම සභාවේ නිරීක්ෂණ විමසීමට නියමිතව තිබුණි. (.....)
29.	1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව යටතේ සමානුපාතික නියෝජන ක්‍රමය මඟින් පාර්ලිමේන්තුවේ සියලු මන්ත්‍රීවරු පත් කර ගනී.	මැතිවරණ කොට්ඨාසයක් සඳහා තරඟ කරන අපේක්ෂකයන් අතුරින් සාපේක්ෂ බහුතරය ලබා ගන්නා අපේක්ෂකයා මේ ක්‍රමය යටතේ මන්ත්‍රීවරයා බවට පත් වේ. (.....)
30.	රාජ්‍යයක අභ්‍යන්තර අරමුණු සහ එම අරමුණු ඉටු කර ගන්නා උපාය මාර්ග විදේශ ප්‍රතිපත්තිය යනුවෙන් හැඳින්වේ.	පාලනය හසුරුවන දේශපාලනය පක්ෂයේ ප්‍රතිපත්ති හා අභිලාස විදේශ ප්‍රතිපත්තියේ ස්වභාවය තීරණය කිරීම සඳහා අනිවාර්යයෙන් බලපායි. (.....)

B කොටස

31. විධායක බලය ක්‍රියාවට නංවන ආකාරය අනුව ආණ්ඩුක්‍රම ආකෘති කිහිපයකි. ඒවායින් 2 ක් නම් කරන්න.
    (1) .....
    (2) .....

32. දේශපාලන විද්‍යාව හැදෑරීම සඳහා පවතින අධ්‍යයන ප්‍රවේශ ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදේ. ඒවා මොනවාද?
    (1) .....
    (2) .....

33. ලිබරල්වාදී දේශපාලන මතවාදයට ජෝන් ලාක් සිදු කළ එකතුවේ ප්‍රධාන තේමා දෙකක් ලියන්න.
    (1) .....
    (2) .....

34. රාජ්‍ය පිළිබඳව ෆැසිස්ට්වාදී නිර්වචන අතරින් වඩාත් කැපී පෙනෙන නිර්වචන දෙකක් තිබේ. ඒවා ලියන්න.
    (1) .....
    (2) .....

35. ග්‍රීක නාගරික රාජ්‍යයට අනන්‍ය වූ අදහස් දෙකක් දක්නට ලැබේ. ඒවා මොනවාද?

(1) .....

(2) .....

36. සමකාලීන ලෝකයේ රාජ්‍ය වල කාර්යභාරයන් 2 ක් ලියන්න.

(1) .....

(2) .....

37. දේශපාලන පක්ෂ ක්‍රම දෙකක් ලියන්න.

(1) .....

(2) .....

38. ප්‍රතිමානීය න්‍යායට විසිවන සියවසේ උදාහරණ 2 ක් ලියන්න.

(1) .....

(2) .....

39. ස්ත්‍රීවාදය විසින් දේශපාලන හා සමාජ විග්‍රහයට එක් කළ නව න්‍යායික සංකල්ප 2 ක් ලියන්න.

(1) .....

(2) .....

40. විද්‍යාත්මක ප්‍රවේශයේ මූලධර්ම 2 ක් ලියන්න.

(1) .....

(2) .....

41. ගැටුම් වැළැක්වීමේ ආකාර දෙකකි. ඒ මොනවාද?

(1) .....

(2) .....

42. පහත සඳහන් කෘතිවල කතුවරුන් ලියන්න.

(1) සාමය උදෙසා න්‍යාය පත්‍රය - .....

(2) ජාතික රාජ්‍යයේ අවසානය - .....

43. නීතියේ ආධිපත්‍යයෙන් අදහස් කරන සංකල්ප දෙකක් ලියන්න.

(1) .....

(2) .....

44. සීමිත ආණ්ඩුව පිළිබඳ සංකල්පය වර්ධනය වීමේ දී එයට එකතු වූ අංග 2 ක් ලියන්න.

(1) .....

(2) .....

45. ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියෙ ගැටළු හා අභියෝග 2 ක් ලියන්න.

(1) .....

(2) .....

46. බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ බලගතු අදහස් හා මූලධර්ම සමූහයක් අයත් වේ. ඒවායින් 2 ක් ලියන්න.

(1) .....

(2) .....

47. 1947 සෝල්බරි ව්‍යවස්ථාවට අනුව ඇති කළ පාර්ලිමේන්තුවේ නීති සම්පාදන බලය සීමාවන ආකාර දෙකක් ලියන්න.

(1) .....

(2) .....

48. (I) 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව යටතේ පනත් කෙටුම්පතක ව්‍යවස්ථානුකූලභාවය පරීක්ෂා කිරීමට බලය පැවති ආයතනය ලියන්න.

.....

(II) එහි සාමාජිකයන් ගණන කොපමණ ද?

.....

49. 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව යටතේ මෙරට දේශපාලන විධායකය කොටස් දෙකකට බෙදා ඇත. ඒවා සඳහන් කරන්න.

(1) .....

(2) .....

50. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව ඇති කළ නව කොමිෂන් සභා දෙක ලියන්න.

(1) .....

(2) .....

***

PAST PAPERS WIKI

Past Papers Wiki

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - පෙරහුරු පරීක්ෂණය 2026
General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2026

13 ශ්‍රේණිය	23	S	II	දේශපාලන විද්‍යාව II Political Science II	කාලය : පැය තුනයි Time : Three hours

අමතර කියවීම් කාලය : මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

උපදෙස් :

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විත වේ.
- I කොටසින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක් ද,
  II කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද,
  III කොටසින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක් ද වශයෙන් තෝරාගෙන ප්‍රශ්න <u>පහකට</u> පිළිතුරු සපයන්න.

I කොටස

(1). දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය පැහැදිලි කරන්න. (ලකුණු 20)

(2). පහත සඳහන් මාතෘකාවලින් දෙකක් පැහැදිලි කරන්න.

(I) දේශපාලන පක්ෂවල කාර්යයන්

(II) බලපෑම් කණ්ඩායම්

(III) විද්‍යාත්මක (වර්යාවාදී) ප්‍රවේශය

(IV) දේශපාලන න්‍යාය

(ලකුණු 10 x 2 = 20)

(3). පහත මාතෘකාවලින් දෙකක් පැහැදිලි කරන්න.

(I) සන්ධීය රාජ්‍යයක ලක්ෂණ

(II) මාක්ස්වාදය

(III) රාජ්‍ය හා ආණ්ඩුව

(ලකුණු 10 x 2 = 20)

II කොටස

(4). (i) 1833 කෝල්බෘක් කැමරන් යෝජනා පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) කෝල්බෘක් කැමරන් යෝජනා මඟින් ඇති වූ සමාජ හා ආර්ථික ප්‍රතිඵල පැහැදිලි කරන්න. (ලකුණු 10)

(5). ඩොනමෝර් ආණ්ඩු ක්‍රමයේ ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 20)

(6). 1947 සෝල්බරි ආණ්ඩු ක්‍රමය හා 1972 ප්‍රථම ජනරජ ආණ්ඩු ක්‍රමය ආශ්‍රයෙන් පහත මාතෘකා සංසන්දනය කරන්න.

(I) නාමික විධායකය

(II) රාජ්‍ය සේවය

(ලකුණු 10 x 2 = 20)

(7). 1978 දෙවන ජනරජ ආණ්ඩු ක්‍රමය ආශ්‍රයෙන් පහත මාතෘකා වලින් දෙකක් සාකච්ඡා කරන්න.

(I) සමානුපාතික නියෝජන ක්‍රමයේ වාසි, අවාසි

(II) ජනමත විචාරණය

(III) පාර්ලිමේන්තුවේ බලතල හා කාර්යය

(IV) ජනාධිපතිවරයාගේ ව්‍යවස්ථාදායක බලතල

(ලකුණු 10 x 2 = 20)

III කොටස

(8). පහත සඳහන් මාතෘකා සාකච්ඡා කරන්න.

(I) ස්විට්සර්ලන්තයේ මධ්‍යම ආණ්ඩුව හා කැන්ටන් අතර සබඳතාවය

(II) ඉන්දියානු සන්ධිය ආණ්ඩු ක්‍රමයේ ඒකීයවාදී ලක්ෂණ

(ලකුණු 20)

(9). ජාත්‍යන්තර දේශපාලනයේ ක්‍රියාධරයෝ පැහැදිලි කරන්න. (ලකුණු 20)

(10).පහත සඳහන් මාතෘකා වලින් දෙකක් පැහැදිලි කරන්න.

(i) සිවිල් සමාජය

(ii) රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාදාමය

(iii) ගැටුම් සමතන ක්‍රියාවලිය

(iv) අර්ධ සන්ධිය ආණ්ඩු ක්‍රමය

(v) බලතල බෙදීම

(vi) සමූහාණ්ඩුවාදය

(ලකුණු 10 x 2 = 20)

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi